www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: මහා වැඩ වර්ජනයේ අඩු සහභාගිත්වය සමිති පිලිබඳ අවිශ්වාසය ප්‍රකාශයට පත් කරයි

## Sri Lanka: Low turnout in general strike expresses lack of confidence in unions

**අපගේ වාර්තාකරු විසිනි**
**2008 ජූලි 11**

ආන්ඩුවේ දුෂ්ඨ බිය ගැන්වීමේ ව්‍යාපාරය නොතකා දස දහස් ගනන් කම්කරුවෝ ශ්‍රී ලංකාවේ ඊයේ පැවති මහා වැඩ වර්ජනයකට එක් වූහ. ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ එක්සත් ජාතික පක්ෂය (එජාප) විසින් නායකත්වය දෙන ලද සමිති සිය ඉල්ලීම් සඳහා සටන් වැදීමට මහජන රැස්වීම්, විරෝධතා රැලි හෝ පෙලපාලි කැඳවීම ප්‍රතික්ෂේප කල බැවින් වර්ජනයට සහභාගි වූ නියම සංඛ්‍යාව මැන ගැනීම අපහසු ය.

වර්ජනය මුලුමනින් ම ආසර්ථක වූ බවට ආන්ඩුවේ ඇමතිවරු ප්‍රකාශ කල අතර, ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී සහ සමිති නායක කේ.ඩී. ලාල්කාන්ත පැවසුවේ එය "සියයට 70ක් සාර්ථක" බවයි. සහභාගිත්වය ඒකාකාර නො වූ අතර එය ජවිපෙ හා එජාප බලාපොරොත්තු වූ ප්‍රමානයට වඩා බෙහෙවින් අඩු බව පෙනෙයි. වර්ජනයට වතු කම්කරුවන්ගෙන් බලගතු සහයෝගයක් ලැබුනු නමුත් පුද්ගලික හා රාජ්‍ය අංශවල කම්කරුවන්ගෙන් බහුතරයක් එයට සහභාගි නොවූහ.

සාපේක්ෂ වසයෙන් අඩු සහභාගිත්වය ජීවන මට්ටම්වලට එරෙහි ආන්ඩුවේ ප්‍රහාර සම්බන්ධයෙන් කම්කරුවන් අතර පවත්නා විරුද්ධත්වයේ මොන යම් හෝ අඩු බවක් නිසා සිදු වූවක් නොවේ. එමෙන් ම, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව තමන් යලි ඇරඹූ යුද්ධය සඳහා කැපකිරීම් කල යුතු බවට ආන්ඩුව කරන කියාපෑම් කම්කරුවන් විසින් පිලිගෙන ඇති නිසා ද නොවේ. මාසික වැටුප රුපියල් 5000කින් වැඩි කිරීම, ජීවන වියදම් දීමනාව අඛන්ඩව ලබා දීම සහ බස් හා දුම්රිය ගාස්තු අඩු කිරීම යන වර්ජනයේ ඉල්ලීම්වලට පවතින්නේ පුලුල්ව පැතිරුනු සහයෝගයකි.

කෙසේ වෙතත්, මොන යම් හෝ වැටුප් වැඩි වීමකට ආන්ඩුව දක්වන විරුද්ධත්වයට නැවත නැවතත් යටත් වී ඇති වෘත්තීය සමිති නායකයන් සම්බන්ධයෙන්, කම්කරුවන් විශාල කොටසක් තුල, කිසිදු විශ්වාසයක් නැත. සියලුම සම්පත් යුද්ධය වෙනුවෙන් කැප කල යුතු බවට ජනාධිපති මහින්ද රාජපක්ෂ කරන අවධාරනයට ප්‍රතිචාර දක්වමින්, වෘත්තීය සමිති පසුගිය වසර දෙක තිස්සේ, වරාය හා වතුකරය තුල, ගුරුවරුන් හා සෞඛ්‍ය සේවකයන් අතර ඇතුලු වර්ජන මාලාවක් ම නතර කර තිබේ. විශේෂයෙන් ම, ස්වෝත්තමවාදී ජවිපෙ, රාජපක්ෂගේ වර්ගවාදී යුද්ධයට මුලුමනින් ම සහයෝගය දෙයි.

වතු කම්කරුවන්ගෙන් ලැබුනු බලගතු සහයෝගය වර්ජනයේ ප්‍රතිවිරෝධී ස්වභාවය පෙන්නුම් කරයි. ජවිපෙ සිංහල අධිපතිවාදයට ද යුද්ධයට එය දෙන සහයෝගයට ද සතුරු අති බහුතරයක් දෙමල කතා කරන වතු කම්කරුවන් අතර ජවිපෙ නායකත්වය දෙන සමස්ත ලංකා වතු කම්කරු සංගමයට ආනුභාවයක් නැති තරම් ය. එහෙත් හැටන්, තලවාකැලේ, නුවරඑලිය, බොගවන්තලාව සහ බන්ඩාරවෙල වැනි මධ්‍යම කඳුකරයේ දිස්ත්‍රික්කවල වතු කම්කරුවන්ගෙන් සියයට 90කට ආසන්න ප්‍රමානයක් වර්ජනයට සහභාගි විය.

වතු කම්කරුවන් වර්ජනයට එක් වීම ජවිපෙට සහාය දීම සඳහා ඔවුන්ගේ යම් මාරුවීමක් කිසිසේත් ම පෙන්නුම් කරනවා නොව, උද්ධමනය වර්තමානයේ සියයට 30 මට්ටමේ පවතින තතු තුල ඔවුන් මුහුන දෙන වඩ වඩා මංමුලා සහගත ආර්ථික තත්වය පිලිබිඹු කිරීමකි. වතු කම්කරුවෝ ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ අඩුම වැටුප් ලබන හා වඩාත්ම සූරාකෑවෙන කොටස්වලට අයත් වෙති. ඊයේ වැඩ නතර කිරීමේ දී, ඔවුහු, වර්ජනය නොකරන ලෙස ආයාචනා නිකුත් කල, ප්‍රධාන වතු සමිති වන ලංකා කම්කරු කොංග්‍රසයේ (සීඩබ්ලිව්සී) සහ කඳුරට ජනතා පෙරමුනේ (යූපීඑෆ්) නායකත්වයන්ගේ අන උල්ලංඝනය කලහ. දේශපාලන පක්ෂ ලෙස ද ක්‍රියාත්මක වන සීඩබ්ලිව්සී සහ යූපීඑෆ් යන දෙක ම රාජපක්ෂගේ පාලක සභාගයේ කොටස්කරුවෝ ය.

මීට පෙර වැඩි වැටුප් ඉල්ලා ක්‍රියාමාර්ගවලට එලඹ තිබූ සෙසු කම්කරු කොටස් අතර සහභාගිත්වය අඩු විය. පසුගිය ඔක්තෝබරයේ දී ගුරුවරු 200,000ක් පමන එක් දින වර්ජනයකට එක් විය. ඊයේ වැඩ වැරුමට සහභාගි වූයේ ඉන් අඩකටත් වඩා අඩු සංඛ්‍යාවකි. රජයේ මුද්‍රනාලයේ හා ආන්ඩුවේ කර්මාන්ත ශාලාවේ ශ්‍රම බලකාය මෙන් ම, ප්‍රධාන රෝහල්වල වෛද්‍ය-නොවන කාර්ය මන්ඩලයෙන් සැලකිය යුතු කොටසක් ද වර්ජනයට එක් විය. ප්‍රවාහන කම්කරුවන් සහභාගි

වූයේ සුලු ප්‍රමානයකි. පුද්ගලික ආයතනවල සිය ගනනක් කම්කරුවෝ වර්ජනයට එක් වූහ.

වර්ජනයට සහභාගි වූ අයට, ආන්ඩුවේ සංකේන්ද්‍රිත බිය ගැන්වීමේ ප්‍රචාරක ව්‍යාපාරයට අභියෝග කිරීමට සිදු විය. බෝම්බ භීතියක් පිලිබඳ ලැබුනු ඔත්තු පිලිබඳ කඩතුරාව යටතේ. පොලීසිය හා සොල්දාදුවන් කොලඹ පුරා ආන්ඩුවේ වැඩපොලවල්, දුම්රිය ස්ථාන, බස් නැවතුම් පොලවල් බොහොමයක සහ තවත් ස්ථාන ගනනාවක යොදවා තිබුනි. බදාදා පොලීසිය අංගොඩ රෝහලේ ශාඛා සමිති නායකයන් අත් අඩංගුවට ගත් අතර ඔවුන් නිදහස් කෙරුනේ කම්කරුවන් වහාම වැඩ නතර කිරීමකට එලඹුනු පසුව පමනි. බ්‍රහස්පතින්දා ආන්ඩුව කම්කරුවන් ත්‍රස්ත කිරීම හා බිය ගැන්වීම පිනිස ඇමතිවරු හා පලාත් සභා මන්ත්‍රීවරු වැඩපොලවලට එව්‌ ය.

වර්ජකයන් එල්ටීටීඊයේ අත් ශක්තිමත් කරමින් සිටින බව ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක කෙහෙලිය රඹුක්වැල්ල බදාදා ප්‍රකාශ කලේ ය. ආන්ඩුව රුපියල් 5000 ඉල්ලීම ලබා දුන හොත්, “ආරක්ෂක වියදම් කප්පාදු කරන්න සිදු වේවි. ඒකයි එල්ටීටීඊ එකට ඕන. . . . ඒක නිසා මේ දෙක (සමිති සහ එල්ටීටීඊය) අතර යම් සම්බන්ධයක් තියෙන්න පුලුවන්.” යයි ඔහු පැවසී ය.

බදාදා පාර්ලිමේන්තුවේ දී කතා කරමින්, සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වා අනතුරු ඇඟවූයේ, “වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය මර්දනය කිරීමේ අයිතිය ආන්ඩුවට ඇති” බවට යි. ඔහු තව දුරටත් මෙසේ පැවසී යඃ “ඔවුන්ගේ hire and fire policy (සේවයට බඳවා ගැනීමේ හා හිතුමනාපේ දොට්ට දැමීමේ පිලිවෙත) මගින් චීනයේ පවා වෘත්තීය සමිති ක්‍රියාමාර්ග මර්දනය කරනවා.” මෙම අවසන් ප්‍රකාශය ජවිපෙට එල්ල කෙරුනකි. ජවිපෙ විටින් විට තමන් “සමාජවාදී” බව කියාපාන අතර චීනයේ ස්ටැලින්වාදී නිලධරය සමග සමීප සබඳතා පවත්වා ගෙන යයි.

ජවිපෙ නායකත්වයෙන් යුත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය (එන්ටීයූසී) දැනටමත් ආන්ඩුවේ යුදවාදී ප්‍රචාරයට නතු වෙමින් වත්මන් වැටුප් උද්ඝෝෂනය නතර කර දැමීමට සූදානම් වන බවට සැම සලකුනක් ම පවතී. එන්ටීයූසී නායක ලාල්කාන්ත පසුගිය ඉරිදා ලක්බිම පත්‍රයට පැවසුවේ, යුද්ධය වෙනුවෙන් යම් කැපකිරීම් කිරීමට ආන්ඩුව සූදානම් නම්, “ආන්ඩුව ලබා දී ඇති රුපියල් 625 වැඩි වීම භාර ගෙන ඉවසාගෙන සිටින ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටින්න අපට පුලුවන්” යනුවෙනි.

ලාල්කාන්ත, අඟහරුවාදා *ස්වර්නවාහිනී* රූපවාහිනියේ වැඩසටහනකට සහභාගි වෙමින්, යුදධය සඳහා ජවිපෙ පූර්න සහයෝගය යලි සහතික කර සිටියේ ය. ඔහු මෙසේ පැවසී යඃ “යුද්ධයේ ආරම්භයේ ඉඳන් ම, එය පිටුපසින් සමාජය පෙල ගස්වන්න අපි එක්වුනා. වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවල නොයෙදෙන ලෙස අපි අනෙක් වෘත්තීය සමිතිවලින් පවා ඉල්ලුවා.” ඔහු මෙසේ පොරොන්දු වියඃ “රට අරාජකත්වයට තල්ලු කිරීමකින් තොරව අපි අපේ වර්ජනය ගෙන යනවා.”

වර්ජනයෙන් අනතුරුව පවා, ආන්ඩුව වැටුප් ඉල්ලීම් සම්බන්ධයෙන් අංශු මාත්‍රයක හෝ සහනයක් දීම ප්‍රතික්ෂේප කර තිබේ. ඊයේ පාර්ලිමේන්තුවේ දී කතා කරමින්, මාධ්‍ය ඇමති අනුර ප්‍රියදර්ශන යාපා අනතුරු අඟවා සිටියේ, එජාප සහ ජවිපෙ යලිත් වරක් වර්ජන ක්‍රියාමාර්ගයකට ගිය හොත් ඔවුන්ට “දරුනු ප්‍රතිවිපාකවලට” මුහුන දීමට සිදු වන බව යි. ජවිපෙ සහ එන්ටීයූසී ක්‍රියාවන් සඳහා කිසිදු නව සැලසුමක් නිවේදනය කර නැත. ඔවුන් කියා ඇත්තේ සමිති නායකයන් උද්ඝෝෂනය පිලිබඳව සාකච්ඡා පවත්වන බව පමනකි.

සමාජවාදී සමානතා පක්ෂය ආරම්භයේ පටන් ම අනතුරු අඟවා සිටියේ, යුද්ධයට විරුද්ධ වීමේ දේශපාලන ක්‍රියාමාර්ගයකින් තොරව, කම්කරු පන්තියට සිය අති මූලික අයිතීන් ආරක්ෂා කර ගත නොහැකි බව යි. වැටුප් හා සේවා කොන්දේසි වෙනුවෙන් සටන් වැදීමේ ක්‍රියාමාර්ගයක් සොයමින් සිටින කම්කරුවන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, උද්ඝෝෂනය සමිති නායකයන්ගේ අත්වලින් සියතට ගන්නා ලෙස කැඳවුම් කරන සහ අරගලය ඉදිරියට ගෙන යනු පිනිස විප්ලවවාදී ඉදිරිදර්ශනයක් ඉදිරිපත් කරන “වැටුප් හා සේවා කොන්දේසි සඳහා සටන් වැදීමට සමාජවාදී ක්‍රියාමාර්ගයක්” යන මැයෙන් යුත් සසප ප්‍රකාශය බැරෑරුම්ව අධ්‍යයනය කරන ලෙස යි.

© www.wsws.org